# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2016 ජනවාරි මස 14 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2016. 01. 18 දින නිකුත් කරන ලදී)**

## ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හර්ෂණ රාජකරුණා මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 11.00** **තැපැල් ගාස්තුව : රු. 10.00**

## ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)

එල්. ඩී.— ඕ.(අයි.එන්.සී.) 10/2015

**ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

“ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක් එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී ආයතනයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවනු ලැබූ හෙයින් ද :

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින්ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක දරන ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු “ආයතනය” යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය ” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා එය

පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාව තුළ පරිසර වෘත්තීයවේදීන්ගේ කීර්තිය හා ගරුත්වය පිළිගැනීම නැංවීම ;

(ආ) මහජනතාව අතර පාරිසරික දැනුම පතල කිරීම ; සහ

(ඇ) ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා භෞතික පරිසරය වර්ධනය කිරීම හා සංරක්ෂණය කිරීම—

සංස්ථාවේ කාර්යයන්.

**4.** සංස්ථාවේ කාර්යයන් කවරේ ද යත් :—

(අ) පරිසර වෘත්තීයවේදීන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් අතර මනා සම්බන්ධතාවයක් ගොඩනැංවීම හා සමාජ, ආර්ථික, පාරිසරික අරමුණු අතර තුලනාත්මකභාවයක් පවත්වා ගෙනයාම හා නඩත්තු කිරීමට සහාය වීම ;

(ආ) පාරිසරික සාධක කෙරෙහි ඇති දැනුම, ජාතික හා ජාත්‍යන්තර බැඳියාව හා තුලනය කිරීම සඳහා හඳුනා ගැනීම ;

(ඇ) පාරිසරික සාධයකයන් පිළිබඳ විද්‍යාත්මක පදනම හා ඉදිරි දැක්ම වර්ධනය කිරීමේ අරමුණින් පර්යේෂණ කිරීම ධෛර්යමත් කිරීම ;

(ඈ) පාරිසරික තොරතුරු ප්‍රචාරය කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික් පුස්තකාල හා තොරතුරු පද්ධති සමග සම්බන්ධතාවයක් ගොඩනැංවීම ;

(ඉ) පරිසර විද්‍යාඥයින් සහ අනෙකුත් අයට පුහුණු වැඩසටහන් හා දැනුම වර්ධනය කිරීම පිණිස සහාය ලබා දීම;

(ඊ) පාරිසරික කටයුතු පිළිබඳව දැනුවත් කිරීම හා ඒ වෙනුවෙන් උපදෙස් දීම ;

(උ) අදාළ පාරිසරික සාධක වර්ධනය කිරීම සඳහා කථිකාවතක්

ඇති කිරීමට බලාත්මක වේදිකාවක් සැපයීම ; සහ

(ඌ) පරිසර ප්‍රකාශන ප්‍රකාශනය සඳහා අනුග්‍රහ දැක්වීම.

සංස්ථාවේ බලතල.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව පහත සඳහන් කටයුතු, එනම් :—

(අ) චංචල හෝ නිශ්චල දේපල කවර හෝ ආකාරයකින් අත් කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම් ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදි කිරීම, සහ ඒවායේ වෙනස්කම් කිරීම ;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට කෙලින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ අනුනියෝජිතයකු මාර්ගයෙන් ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම ;

(ඇ) සංස්ථාවේ අරමුණුවලට අදාළ පාඨමාලා මෙහෙයවීම විභාග පැවැත්වීම සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීම ;

(ඈ) සභාවේ අනුමැතිය ඇතිව ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම සහ බැංකුවක ජංගම තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම ;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය වන මුදල් කළමනාකරණ සභාව තීරණය කරන ආකාරයට ආයෝජනය කිරීම හෝ ණයට මුදල් දීම හෝ ණයට දීම ;

(ඊ) විවිධ සාමාජිකයන්ගේ වර්ගීකරණය කිරීම සඳහා ලියාපදිංචි වීමට ගෙවිය යුතු ගාස්තු, විභාග ගාස්තු, පාඨමාලා ගාස්තු තීරණය කිරීම ;

(උ) අරමුදල් රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රධාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම ;

එසේ වුව ද, මේ පනතට වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාව වෙත ලබාදෙනු ලබන විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් සභාව

විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ණ අනුමැතිය ලබාගත යුතු ය. ;

(ඍ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම විනය ක්‍රියාමාර්ග ගැනීම ; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ළඟා කර ගත හැකි හෝ මුදුන්පමුණුවා ගැනීමට අවශ්‍ය හෝ හිතකර සියලු පියවර ගැනීම.

සංස්ථාවේ සාමාජිකයන් වර්ගීකරණය.

**6.** (1) සංස්ථාවේ සාමාජිකයන් පහත සඳහන් පරිදි වර්ගීකරණය විය යුතු ය.

(අ) සාමාජික ;
(ආ) වරලත් සාමාජික ;
(ඇ) සහාධ්‍යය සාමාජික ;
(ඈ) ආශ්‍රිත සාමාජික ;
(ඉ) ශිෂ්‍ය සාමාජික ;
(ඊ) ගරු සාමාජික ;
(උ) සංස්ථාපිත සාමාජික ;
(ඍ) යාවජීව සාමාජික ;

(2) ඉහත සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සුදුසුකම් පනතේ සඳහන් රීති මගින් විස්තර කරනු ලැබේ:—

(3) (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (උ) හා (ඍ) යන වර්ගයන්ට අයත් සාමාජිකයන් ප්‍රධාන කමිටුවට හා ඕනෑම අනු කමිටුවකට තෝරා පත් කර ගැනීම සඳහා සුදුසුකම් ලබන අතර, ඔවුන්ට ඡන්දය භාවිතා කිරීම ඇතුළු සියලු අයිතිවාසිකම් සහ වරප්‍රසාද හිමිවේ.

සංස්ථාවේ සාමාජිකත්වය සඳහා ගාස්තු.

**7.** (1) 6 වන වගන්තිය ඇති ප්‍රතිපාදනවලට සහ එහි රීතිවලට අනුකූලව සාමාජිකයන් වීමට සුදුසුකම් සපුරන පුද්ගලයකු නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු සුදුසුකම් ලැබිය යුත්තේ ය.

(2) මෙහි (3) වන උප වගන්තියේ රීතිවලට අනුව ආයතනයේ සාමාජිකයකු ලෙස බඳවා ගැනීම වලංගු වන්නේ එම වසරේ දෙසැම්බර් මස 31 වන දින දක්වා පමණක් වන අතර, නියමිත මුදල ගෙවීමෙන් පසු සාමාජිකත්වය අළුත් කළ හැක.

(3) වාර්ෂිකව සාමාජික මුදල් ගෙවන සාමාජිකයන් සහ යාවජීව සාමාජිකයන් සඳහා මෙම පනතේ රීති හා වගන්ති අදාළ වේ.

නාම භාවිතා කිරීම.

**8**. සංස්ථාවේ සාමාජිකයකු ලෙස ලියාපදිංචි වූ සෑම සාමාජිකයකුටම තමා සාමාජිකයකු බව පෙන්වීම පිණිස තම නමෙහි අගට M.I.E.P.(Sri Lanka) යන කෙටි නිල නාමය යෙදීමේ අයිතිය ඇත්තේ ය. වරලත් සාමාජිකයකු සඳහා C.Env (Sri Lanka) ලෙසට තම නමෙහි අගට යෙදීමේ අයිතිය ඇත්තේ ය.

(2) සංස්ථාවේ සාමාජිකයකු ලෙස ලියාපදිංචි වූ සෑම සාමාජිකයකුටම තමා සහාධ්‍යය සාමාජිකයකු බව පෙන්වීම පිණිස තම නමෙහි අගට F.I.E.P. (Sri Lanka) යන කෙටි නිල නාමය යෙදීමේ අයිතිය ඇත්තේ ය.

(3) 1 වන හා 2 වන වගන්ති ඇති ප්‍රතිපාදනවලට සහ එහි රීතිවලට අනුකූලව සාමාජිකයකු වීමට සුදුසුකම් සපුරන පුද්ගලයකු නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු සුදුසුකම් ලැබිය යුත්තේ ය.

සභාවේ සංයුතිය.

**9**. (1) ආයතනයේ පරිපාලනය සඳහා වගකියනු ලැබිය යුතු (මෙහි මින් මතු ‘‘සභාව’’ යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් තිබිය යුතු ය.

(2) සභාව ආයතනයේ සාමාජිකයන් අතුරින්, එම සාමාජිකයන් විසින් තෝරාපත් කර ගනු ලබන සභාපතිවරයකු සහ ලේකම්වරයකු සමන්විත විය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වූ දිනයේ දී ධුර දරන සභාවේ සාමාජිකයන්, මේ මගින් පිහිටුවනු ලබන ආයතනයේ පළමුවන සභාවේ සාමාජිකයන්. මේ මගින් පිහිටුවන ලබන ආයතනයේ පළමුවන සභාවේ සාමාජිකයන් විය යුතු ය.

(4) කාලය ඉකුත් වීම නිසා තම ධුරය අත් හරින සභාවේ යම් සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(5) සභාවේ සෑම සාමාජිකයෙකු ම මියයාමේ දී ධුරය අත්හැරීමකදී ධුරයෙන් ඉවත් කිරීමක දී හැර තමා පත් කිරීමේ දින සිට අවුරුදු එකක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(6) සභාවේ සාමාජිකයකු ඉල්ලා අස්වීම මගින් හෝ ආයතනයේ සාමාජිකයෙකු වීම අවසන් වුවහොත් තම ධුරය අත්හල යුතු ය.

(7) සාමාජිකයකු මිය යාමේදී හෝ සභාවේ සාමාජිකයකු විසින්

ධුරය අත් හැරීමක දී එම සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කිරීම කළයුතු අතර, එම සාමාජිකයාගේ කල් ඉකුත් නොවූ කාලය සඳහා ධුර දැරිය යුතු ය.

සාමාජිකයකු පත් කිරීමේ ලා යම් දෝෂයක් තිබීමේ හෝ සාමාජිකයකුගේ පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා ආයතනයේ ක්‍රියා හෝ කටයුතු අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු බව.

**10**. සභාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ සභාවේ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් ආයතනයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු ය.

සභාවේ රැස්වීම්.

**11**. (1) සභාවේ රැස්වීම අවම වශයෙන් මසකට එක් වරක්වත් පවත්වනු ලැබිය යුතු ය.

(2) සභාවේ සෑම රැස්වීමක් පිළිබඳව, එක් එක් සාමාජිකයාට අවම වශයෙන් දින හතක් දැන්වීමක් ලිඛිතව කළ යුතු ය.

(3) සභාවේ සාමාජිකයන් දස දෙනකු විසින් තත් කාර්යය සඳහා ලිඛිතව ඉල්ලීමක් කර දින හතක් ඇතුළත එසේ තිබියදීත් (2) වැනි උපවගන්තිය යටතේ සභාපතිවරයා විසින් සභාවේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

(4) සභාවේ රැස්වීම්වල දී සභාපතිවරයා මුලසුන දැරිය යුතු අතර, සභාපතිවරයා පැමිණ නොසිටින විට එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් බහුතරයක් විසින් තෝරාපත් කරගනු ලබන සාමාජියෙක් එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(5) සභාවේ රැස්වීම්වලට සභාපතිවරයා මුලසුන දැරීම සඳහා පැමිණ නොසිටින විට (4) වැනි උපවගන්තියට අනුව හෝ ඊට අමතරව සභාපතිවරයාට තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

සභාවේ රැස්වීම් සහ රීති සෑදීමේ බලය.

(6) මෙහි අන්තර්ගත විධිවිධානවලට යටත් ව, සභාවේ කටයුතු සිදු කිරීමේ කාර්ය පටිපටිපාටිය සභාව විසින් ම තීරණය කරනු ලැබිය යුතු ය.

**12**. (1) කලින් කලට සංස්ථාවේ යම් මහා සභා රැස්විමක දී සහභාගි වී ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත සඳහන් කරුණු සියල්ලටම අදාළව හෝ එයින් එකකට මෙම පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සම්පාදනය කිරීම සංස්ථාවට නිත්‍යානුකූල වන්නේ ය.

(2) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා හෝ මින්මතු සාදනු ලබන හෝ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබිය යුතු ආකාරයෙන් ම හැර වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කරනු නොලැබිය යුතු ය.

(3) සභාවේ සාමාන්‍ය රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයින් විසි පස් දෙනෙකු විය යුතු ය.

(4) මෙම වගන්තියේ (1) වන උපවගන්තියේ හැර, මේ පනතට සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය :—

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, බඳවා ගැනීම සහ ලියාපදිංචි කිරීම, සාමාජිකයන් නෙරපීම, සාමාජිකයන්ගේ සුදුසුකම් හා නුසුදුසුකම්, ආකෘති පත්‍ර හා සාමාජිකත්ව සහ සහතික නිකුත් කිරීම, සාමාජික නාමලේඛන නඩත්තු කිරීම, සාමාජික මුදල් අඩු කිරීම හෝ ලිහිල් කිරීම, සාමාජික ගාස්තු නොගෙවීමේ බලපෑම හා අයිතිය, සාමාජිකයන්ගේ වරප්‍රසාද හා කාර්ය භාරයන් ;

(ආ) සභාවේ ධුරයන්ගේ කොන්දේසි හා නියම, සුදුසුකම් හා තෝරා ගැනීමේ පටිපටියන්, ලියාපදිංචි කිරීම, පුරප්පාඩු පිරවීම් හා බඳවා ගැනීම්, ධුරයන් සහ සභාවේ ධුරයන් හි බලය අභිනියෝජනය කිරීම ආයතනයේ මණ්ඩලයේ උප කමිටු සහ බඳවා ගැනීම් ;

(ඇ) ආයතනයේ රැස්වීම්, එම රැස්වීම්වල දැන්වීම් සහ න්‍යාය පත්‍රය ඒ සඳහා ගනපූරණය සහ එහි දී සිදු කරන ලබන කාර්යයන් ;

(ඈ) ආයතනයේ දේපල කළමනාකරණය සහ අරමුදල්වල ආරක්ෂාව ;

(ඉ) වෘත්තීමය පාලනය සඳහා රීති සංග්‍රහයක් ඇති කිරීම ;

(ඊ) විනය පරීක්ෂණ ක්‍රමවේදය ඒ සඳහා විනය කමිටු පත් කිරීම සහ නීති ආධාර සැපයීම, පැමිණිලි විභාග කිරීම, සිතාසි නිකුත් කිරීම ඕනෑම පුද්ගලයකු කැඳවීම, පරීක්ෂණවල සටහන් තබා ගැනීම සහ එවැනි සිදුවීම් පිළිබඳව එම කමිටු වලට වාර්තා කිරීම ;

(උ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය යුතු ය;

(ඌ) ආයතනයේ කාර්ය මණ්ඩලය සේවයෙන් පහ කිරීම හෝ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය සිදු කළ හැකි ය ;

(එ) කර්ය මණ්ඩලයේ පඩි හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කරනු ලැබිය හැකි ය ; සහ

(ඒ) කාර්ය මණ්ඩලයේ සේවය පිළිබඳව නියම හා කොන්දේසි තීරණය කළ හැකි ය.

(5) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය. සාමාන්‍ය නුසුදුසුකම්.

**13.** (1) ආයතනයේ සාමාජිකයෙකු ලෙස මෙහි කිසිවකු බඳවා ගනු නොලැබේ.

(2) (අ) සිහිවිකල් වූ පුද්ගලයකු ලෙස ඔහුව පිළිගත් අධිකරණයකින් තීරණය කර ඇති අවස්ථාවක දී ;

(ආ) බංකොලොත් හෝ බුන්වත් බවට පත්වී ඇතැයි අධිකරණයකින් තීරණය කර ඇති අවස්ථාවක දී, ඔහුගේ බංකොලොත්භාවය, බුන්වත් භාවය ඇතිවී ඇත්තේ නොලැබීම හෝ පාලනය කර ගත නොහැකි තත්ත්වයන් තුළින්, අර්ධ ලෙස හෝ සම්පූර්ණ වශයෙන් ;

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් රටක දී චූදිතයකු ලෙස

පිළිගත් අධිකරණයකින් තීරණය කර ඇති අවස්ථාවක දී විෂමාචාරයක්, සිරගතවීමකින් දඬුවම් දිය හැකි වරදක් හා ඒ හා සමාන වරදක් සහ පොදු සමාවකට ලක් වූ පුද්ගලයකුට.

(2) උක්ත (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති නුසුදුසුතාවයකට පත්වී ඇති නම්, ආයතනයේ ඕනෑම සාමාජිකයෙකු බඳවා ගැනීම සභාව විසින් අහෝසි කරනු ලැබේ.

ඒ කෙසේ වුව ද එවැනි පුද්ගලයෙකු නැවත බඳවා ගැනීමේ සුදුසුකම් සම්පූර්ණ කළ ද එවැනි බඳවා ගැනීම් අහෝසි කිරීමක් සභාවට වලක්වා ලිය නොහැකිය.

සංස්ථාවේ අරමුදල.

**14.** (1) ආයතනයට ම එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) (අ) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී ආයතනයට ලැබුණු සියලු මුදල් ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. ;

(ආ) ලංකාව තුළ හෝ ඉන් පිටතින් ආයතනයට ලැබෙන ත්‍යාග, පරිත්‍යාග හා දායක මුදල් ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය, හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුදල් වර්ෂය.

**15.** සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේ ද යන බව.

**16.** සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනකු හා ලේකම් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

තොරතුරු හෙළිදරව් කිරීම තහනම් කිරීම.

සංස්ථාව විසින් යම් පුද්ගලයෙකු වෙනුවෙන් වියදම් දැරිය හැකි බව.

**17.** සභාවේ සාමාජිකයකු, ආයතනයේ නිලධරයකු හෝ සේවකයකු විසින් කිසියම් නීතියක් යටතේ අධිකරණයක් ඉල්ලීමක් කරන අවස්ථාවක හෝ තමන්ගේ රාජකාරි ඉටු කරන අවස්ථාවක දී හැර මෙම පනත යටතේ තොරතුරු හෙළිදරව් නොකළ යුතු ය.

**18.** යම් අධිකරණයක දී ඕනෑම පනතකින් යම් පුද්ගලයකුට විරුද්ධව නඩු පැවරීමක් හෝ නඩු කෘත්‍යයක් සඳහා යම් පුද්ගලයකු විසින් දරන ලද වියදම්, මෙම පනත යටතේ ඔහු එම ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යැයි අධිකරණය අදහස් කරන්නේ නම් මෙම පනත යටතේ හෝ සංස්ථාවේ නිර්දේශය යටතේ ආයතනයේ අරමුලින් ගෙවිය හැක.

විගණනය හා ගිණුම්.

**19.** (1) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ “සුදුසුකම් ලත් විගණකවරයා” යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී ආයතනයක, එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව වන්නා ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ

ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්, අදහස් වේ.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**20.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හෝ හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**21.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.